ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව
නීතිවේදී උපාධි පාඨමාලාව - 03 වන මට්ටම
අවසාන පරීක්ෂණය - 2023/2024
සාධාරණත්වයේ මූලධර්ම - LLU3502
කාලය පැය තුන (03) යි.

---

දිනය : 2025 මැයි 20 | වේලාව : ප.ව. 01.30 - ප.ව. 04.30

---

මුළු ප්‍රශ්න ගණන - 08.

**I කොටසින් ප්‍රශ්න එකක් හා II කොටසින් ප්‍රශ්න හතරක් ද ඇතුළුව ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

විභාග අපේක්ෂකයන්ගේ අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

## I කොටස - සාධාරණත්වයේ මූලධර්ම

1. ඉංග්‍රීසි නීති පද්ධතියෙන් මූලාරම්භ වූ තැන සිට නූතන නීති රාමුවලට ඒකාබද්ධ වීම දක්වා සාධාරණත්වයේ මූලධර්මවල ඓතිහාසික වර්ධනය සාකච්ඡා කරන්න.

ඔබේ පිළිතුර අදාළ අධිකාරීන් ඇසුරෙන් තහවුරු කරන්න.

(ලකුණු 20)

2." සාධාරණත්ව ආප්තයන් යනු නිශ්චිත රීතියක් හෝ නීතියේ මූලධර්මයක් නොවේ. එය සාධාරණත්ව සංකල්ප සහ මූලධර්මවලට යටින් දිවෙන පුළුල් තේමාවක සාරාංශ ප්‍රකාශයකි."
ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේ ද?

පහත දැක්වෙන සාධාරණත්ව ආප්තයන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් ඔබේ පිළිතුර සඳහා හේතු දක්වන්න. ඔබේ පිළිතුරට අදාළ නඩු තීන්දු නීතියෙන් සහාය දැක්විය යුතුය.

(i) සාධාරණත්වය පුද්ගලයට එරෙහිව පමණක් ක්‍රියාත්මක වේ. (Equity acts in *personam*)

(i) සාධාරණත්වය යටතේ සෑම හානියකට ම ප්‍රතිකර්මයක් ඇත. (Equity will not suffer a wrong to be without a remedy.) **(ලකුණු 20)**

## II කොටස - භාර නීතිය

3. (අ) "භාර ආඥා පනතේ 02 වන වගන්තිය මඟින් *casus omissus* අවස්ථාව යටතේ ඉංග්‍රීසි නීතියේ මූලධර්ම යෙදීමට ඉඩ සලසයි."

ඉහත ප්‍රකාශය සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකාවේ භාර ආඥා පනතේ 2 වන වගන්තියේ යෙදීම විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න. විනිශ්චිත නඩු තීන්දු මඟින් ඔබේ පිළිතුර තහවුරු කරන්න. **(ලකුණු 12)**

(ආ) භාරයක් සහ ෆීතකොමිසමක් (*fideicommissum*) අතර වෙනස පැහැදිලි කරන්න. **(ලකුණු 8)**

4. ප්‍රනාන්දු මහත්මියගේ අන්තිම කැමැති පත්‍රයෙහි ඇතුළත් පහත සඳහන් පැවරීම් වලංගු භාර නිර්මාණය කරන්නේ ද යන්න සාකච්ඡා කරන්න:

(අ) මගේ නර්තන ඇකඩමියේ වාර්ෂික ආදායමෙන් සාධාරණ මුදලක් තම පුත් රුමිත්ගේ ප්‍රයෝජනය සඳහා භාවිත කිරීමට මගේ දියණිය නයනාට.

(ආ) මගේ පවුලේ වඩාත් ම කැමති සාමාජිකයන් අතර එය බෙදා දෙනු ඇතැයි යන බලාපොරොත්තුවෙන්, බණ්ඩාරවෙල පිහිටි මගේ තේ වත්ත මගේ සහෝදරිය වන කලනිට.

(ඇ) මගේ සුරතල් බල්ලන්ගේ ප්‍රයෝජනය වෙනුවෙන්, සුරතල් බලු කූඩුවක් නඩත්තු කිරීම සඳහා භාවිත කිරීමට මගේ ඉතිරිකිරීමේ ගිණුමෙන් මගේ සහෝදර කපිලට රුපියල් මිලියන 1ක්.

(ඈ) තම උසස් අධ්‍යාපනය සඳහා භාවිත කිරීම සඳහා රුපියල් මිලියන 2ක් මගේ අවුරුදු 16ක් වයසැති මගේ මුනුබුරා වන නුවින්ට.

**(5x4 = ලකුණු 20)**

5. (අ) දමිත් මෝටර් රථ අලෙවි සැලක හිමිකරුවෙකු වන අතර, ශ්‍රී ලංකාවේ පනවන ලද මෝටර් රථ ආනයන තහනම හේතුවෙන් ඔහුගේ ව්‍යාපාරය බංකොලොත් විය. එහි ප්‍රතිඵලයක් ලෙස, ඔහුගේ ණයහිමියන් ණය පියවා ගැනීම සඳහා ඔහු පසුපස හඹා ඒමට පටන් ගත්හ. කෙසේ වෙතත්, දමිත් සතුව ඉඩමක් මිලදී ගැනීම සඳහා භාවිත කිරීමට අදහස් කළ යම් පෞද්ගලික ඉතිරිකිරීම් තිබුණි. දමිත්ගේ සමීප මිතුරෙකු වන කමල්, ණය සමථයකට පත් කළ පසුව දේපළ දමිත්ට මාරු කරන බවට ඇති අවබෝධයෙන් දේපළ ඔහුගේ නමින් මිලදී ගැනීමට එකඟ විය. දමිත් දේපළ සඳහා සම්පූර්ණ මුදල ගෙවීය. මාස කිහිපයකට පසු, දමිත් ඔහුගේ සියලු ණය පියවා, දේපළ

තමාගේ නමට මාරු කරන ලෙස කමල්ගෙන් ඉල්ලා සිටියේ ය. කෙසේ වෙතත්, කමල් දැන් එසේ කිරීම ප්‍රතික්ෂේප කරයි.

දමිත්ට උපදෙස් දෙන්න. **(ලකුණු 10)**

(ආ) ශ්‍රී ලංකාවේ භාර ආඥා පනත යටතේ 'වැඩිදියුණුව පිළිබඳ පූර්ව නිගමනය' (*presumption of advancement* ) හි අදාළත්වය පැහැදිලි කරන්න. අදාළ ව්‍යවස්ථාපිත විධිවිධාන සහ නඩු තීන්දු නීතිය මඟින් ඔබේ පිළිතුරට සහාය දක්වන්න.

**(ලකුණු 10)**

6. "පොදු ස්වභාවයක් ඇති අරමුණක් නම් මිස, කිසිදු අරමුණක් පුණ්‍ය අරමුණක් ලෙස නීතිය පිළි නොගන්නා බව විශ්වීය රීතියකි. එනම්, යම් අරමුණක් ප්‍රජාවේ හෝ ප්‍රජාවේ කොටසක යහපත සඳහා යොමු කළ යුතුය."

Lord Greene M.R. in *Re Compton* [1915] Ch. D. 123 at 128.

ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟ ද?

ශ්‍රී ලංකා නීතිය ඉංග්‍රීසි නීතිය සමඟ සංසන්දනය කරමින්, අදාළ ව්‍යවස්ථාපිත විධිවිධාන සහ නඩු තීන්දු නීතිය සැලකිල්ලට ගෙන ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

**(ලකුණු 20)**

7. ධනපාල යනු ගම්පොල පිහිටි අක්කර 50 ක තේ වත්තක සහ බංගලාවක භාරකරු වේ. භාරයේ ප්‍රතිලාභීන් වන්නේ රාණි සහ ඇගේ පුතුන් දෙදෙනා වන කැලුම් සහ දිලුම් ය. රාණිගේ කැමැත්ත ඇතිව, ධනපාල බංගලාව සංචාරක හෝටලයක් බවට පත් කිරීම සඳහා ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කළේ ය. ප්‍රතිසංස්කරණ කාලය තුළ ඔහු සහ ඔහුගේ පවුලේ අය ගම්පොල පිහිටි සුඛෝපභෝගී හෝටලයක නැවතී සිටියහ. ප්‍රතිසංස්කරණ අවසන් වූ පසු, ධනපාල රාණි සහ ඇගේ පුතුන්ගෙන් ප්‍රතිසංස්කරණ

වියදම් සඳහා වැය වූ මුදල් ඉල්ලා සිටියේ ය. මෙම වියදම්වලට සුඛෝපභෝගී හෝටලයේ ඔහුගේ පවුලේ නවාතැන් සඳහා වැය වන මුදල ද ඇතුළත් විය. බංගලාව ප්‍රතිසංස්කරණය කෙරෙහි ඔහුගේ අවධානය යොමුව තිබූ නිසා, ධනපාල තේ වත්ත නිසි ලෙස කළමනාකරණය කිරීමට අපොහොසත් වූ අතර නියමිත වේලාවට පොහොර සැපයුවේ නැත. එහි ප්‍රතිඵලයක් ලෙස වතුයායේ තේ නිෂ්පාදනය සැලකිය යුතු ලෙස පහත වැටිණි. දැන් කැලුම්ට වයස අවුරුදු 18 ක් වන අතර ඔහු විදේශ උපාධියක් හැදෑරීමට අදහස් කරයි. එබැවින්, තේ වත්තෙන් අක්කර 10 ක් විකුණා ඔහුගේ උසස් අධ්‍යාපනය සඳහා මුදල් ලබා දෙන ලෙස ඔහු ධනපාලගෙන් ඉල්ලා සිටියේ ය. ධනපාල කැලුම්ට නොදන්වා ඉතා අඩු මිලකට ඔහුගේ සහෝදරයා වන ජිනපාලට අක්කර 10 ක් විකුණා දැමීය.

පාර්ශවයන්ගේ අයිතිවාසිකම් සහ වගකීම් සාකච්ඡා කරන්න. ඔබේ පිළිතුරට භාර ආඥා පනතේ අදාළ විධිවිධාන හා නඩු නීතියෙන් සහාය දැක්විය යුතුය.

**(ලකුණු 20)**

8. පහත මාතෘකාවලින් ඕනෑම **දෙකක් (02)** පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(අ) භාර ආඥා පනතේ 90 වන වගන්තිය

(ආ) සී-ප්‍රේ මූලධර්මය ( Cy-pres doctrine)

(ඇ) සදාකාලිකත්වයට එරෙහි රීතිය

(ඈ) භාරකාර දේපළ හඹායාමට ප්‍රතිලාභියාට ඇති අයිතිය

**(10x2 = ලකුණු 20)**

-හිමිකම් ඇවිරිණි-